# සීගිරි ග්ලෝබල් විශ්වවිද්‍යාලය

# පර්යේෂණ මධ්‍යස්ථානය

## ප්‍රකාශන දෙපාර්තමේන්තුව සහ කතුවරයා අතර ගිවිසුම් පත්‍රය

**ගිවිසුම් අංක:** .........
**දිනය:** .........

මෙම ගිවිසුම **පළමු පාර්ශ්වය** ලෙස සීගිරි ග්ලෝබල් විශ්වවිද්‍යාලයේ පර්යේෂණ මධ්‍යස්ථානයේ ප්‍රකාශන දෙපාර්තමේන්තුව (පසුව "ප්‍රකාශකයා" ලෙස හැඳින්වේ) සහ **දෙවන පාර්ශ්වය** ලෙස ............................................... මහතා/මහත්මිය (පසුව "කතුවරයා" ලෙස හැඳින්වේ) අතර සම්පාදනය කරන ලදී.

**1.0 කෘතිය**
කතුවරයා විසින් "..............................................." (පසුව "කෘතිය" ලෙස හැඳින්වේ) නම්වූ පර්යේෂණ ග්‍රන්ථය/නවකතාව/පද්‍යනිර්මාණය ප්‍රකාශකයාට ප්‍රකාශනය සඳහා භාර දී ඇත.

**2.0 භාරදුන් පිටපත**
2.1 ප්‍රකාශකයා කතුවරයා විසින් භාරදෙන ලද පිටපතේ රහස්‍යභාවය ආරක්ෂා කරගැනීමට බැඳී සිටී.
2.2 පිටපත විද්වත් පරීක්ෂණ කමිටුවට (පීර් සමාලෝචන) ඉදිරිපත් කිරීමේදී, කතුවරයාගේ නම ඉවත් කර අන්තර්ගතය පමණක් සමාලෝචනය කරනු ලැබේ.

**3.0 ප්‍රකාශන ක්‍රියාවලිය**
3.1 ඉක්මන් ක්‍රියාවලිය යටතේ මසක් ඇතුළත මුද්‍රණ කටයුතු සම්පූර්ණ කිරීමට ප්‍රකාශකයා බැඳී සිටී.
3.2 සාමාන්‍ය ක්‍රියාවලිය යටතේ දින 60–120 අතර කාලය තුළ කෘතිය මුද්‍රණය කිරීමට ප්‍රකාශකයා බැඳී සිටී.
3.3 පිටපත භාරදීමේ දිනයේ සිට දින 180 ඇතුළත කෘතිය මුද්‍රණය කිරීම සම්පූර්ණ කිරීමට ප්‍රකාශකයා අසමත් වුවහොත්, කතුවරයාට තම පිටපත වෙනත් ප්‍රකාශකයකු වෙත යොමු කිරීමට අයිතිය ලැබේ.
3.4 විද්වත් කමිටු තීරණය (සමාලෝචන වාර්තාව) පිටපත භාරදීමෙන් පසු වැඩකරන දින 10ක් ඇතුළත කතුවරයාට ලබාදීමට ප්‍රකාශකයා එකඟ වේ.
3.5 විද්වත් කමිටු අනුමැතිය ලැබීමෙන් පසු, ග්‍රන්ථ සැකසුමේ මුල් අදියරට අදාළ

ඇස්තමේන්තුගත මුදල් වියදම් කතුවරයාට ලිඛිතව දැනුම් දෙනු ලැබේ.
3.6 සෝදුපත් බැලීමේදී (ප්‍රූෆ් රීඩින්ග්) මෘදු පිටපතක් (සොෆ්ට් කොපි) කිසිදු ආකාරයකින් බෙදා නොදීමට ප්‍රකාශකයා බැඳී සිටී.
3.7 කතුවරයාගේ ඉල්ලීම පරිදි, ටයිප් සැකසුම, කවර සැලසුම, පිටු සැකසුම සහ සංස්කරණ සහය ප්‍රකාශකයා විසින් ලබාදේ.
3.8 මුද්‍රණයෙන් පසු පුස්තකාල සේවා මණ්ඩලයට අදාළ පිටපත් භාරදීම ප්‍රකාශකයාගේ වගකීම වේ.

### 4.0 කතුවරයාගේ එකඟතා

4.1 මෙම ගිවිසුම සම්පූර්ණ කිරීම සඳහා පිටපත පළමු අවස්ථාවේ දීම ප්‍රකාශකයාට භාරදීමට කතුවරයා එකඟ වේ.
4.2 විද්වත් කමිටු අනුමැතිය ලැබීමෙන් පසු ග්‍රන්ථ සැකසුමේ මුල් අදියර සඳහා ඇස්තමේන්තුගත මුදලින් 50% ක් ප්‍රකාශකයාට ගෙවීමට කතුවරයා එකඟ වේ. මෙම ගෙවීම සඳහා ලැබෙන රිසිට්පත කතුවරයා විසින් සුරක්ෂිතව තබාගත යුතුය.
4.3 මෙම ගිවිසුම අත්සන් කිරීමෙන් පසු වසර 5ක කාලය තුළ කෘතිය වෙනත් ප්‍රකාශකයකු වෙත යොමු නොකිරීමට කතුවරයා එකඟ වේ.
4.4 ග්‍රන්ථ සැකසුමේ මුල් අදියර අවසන් වන විට ඉතිරි 50% මුදල් ගෙවා නිම කිරීමට කතුවරයා එකඟ වේ.

### 5.0 මුද්‍රණ ක්‍රම සහ පිටපත් බෙදාහැරීම

පහත දැක්වෙන ක්‍රම තුනෙන් එකක් තෝරාගනු ලැබේ (කතුවරයා සහ ප්‍රකාශකයා එකඟතාවයෙන් තෝරාගන්නා ආකාරය සටහන් කරන්න):

□ **ක්‍රමය 1:**

- සියලු මුද්‍රණ වියදම් කතුවරයා විසින් දරනු ලැබේ.
- මුද්‍රිත පිටපත්වලින් 80% කතුවරයාට හිමි වන අතර, 20% ප්‍රකාශකයාට හිමි වේ.

□ **ක්‍රමය 2:**

- සියලු මුද්‍රණ වියදම් ප්‍රකාශකයා විසින් දරනු ලැබේ.
- මුද්‍රිත පිටපත්වලින් 10% කතුවරයාට හිමි වන අතර, 90% ප්‍රකාශකයාට හිමි වේ.
  (දෙවන හා තෙවන මුද්‍රණවලදී කතුවරයාගේ පිටපත් ප්‍රමාණය 25% දක්වා වැඩි කරනු ලැබේ.)

□ **ක්‍රමය 3:**

- මුද්‍රණ වියදම් කතුවරයා සහ ප්‍රකාශකයා එකට දරනු ලැබේ.
- මුද්‍රිත පිටපත්වලින් 40% කතුවරයාට හිමි වන අතර, 60% ප්‍රකාශකයාට හිමි වේ.

## 6.0 විශේෂ වගකීම්

6.1 ඉහත කුමන ක්‍රමයකින් හෝ කෘතිය පළ කළ ද, ලංකාවේ පුස්තකාල සඳහා වන පිටපත් අලෙවි කිරීමේ ක්‍රියාවලිය ප්‍රකාශන ආයතනයේ ජාතික වගකීම් හා ස්ථාවරත්වය සඳහා ප්‍රකාශකයා විසින් රඳවා ගන්නා බවට කතුවරයා එකඟ වේ.
6.2 කෘතිය පිළිබඳ සිදුකරන සෑම විවෘත සාකච්ඡාවක, සම්මන්ත්‍රණයක හෝ ප්‍රචාරක අවස්ථාවක දී ප්‍රකාශකයා (සීගිරි ග්ලෝබල් විශ්වවිද්‍යාලය – පර්යේෂණ මධ්‍යස්ථානය) පිළිබඳව සඳහන් කිරීමට කතුවරයා එකඟ වේ.

## 7.0 අත්සන්

මෙම ගිවිසුමේ නියමයන් දෙපාර්ශ්වයම කියවා තේරුම් ගෙන එකඟ වන බවට සාක්ෂියක් ලෙස පහත දක්වා ඇති දිනයෙහි අත්සන් කරනු ලැබේ.

### පළමු පාර්ශ්වය – ප්‍රකාශකයා

.....................................................................
නම:
තනතුර:
සීගිරි ග්ලෝබල් විශ්වවිද්‍යාලය – පර්යේෂණ මධ්‍යස්ථානය
දිනය:

### දෙවන පාර්ශ්වය – කතුවරයා

.....................................................................
නම:
ලිපිනය:
දිනය:

(මුද්‍රණ ක්‍රම අංකය: ……… ලෙස තෝරාගෙන ඇත.)